

## ඔබට ප්‍රතිලාභ

පූර්ණ කැපවීමෙන් යුතුව ඔබ මෙම පාඨමාලාව සාර්ථක ව නිමා කළ කල්හි

- රාජකාරි සහ සමාජ කටයුතුවල දී දෙමළ බස කථා කරන්නන් සමග දෙමළ බසින් ඉතා චතුර ලෙස කථා කිරීමේ
- දෙමළ ජනතාවගේ සංස්කෘතික පසුබිම මත පදනම් ව ගෞරවාන්විත අයුරින් දෙමළ ජනතාව සමග සංනිවේදනය කිරීමේ
- දෙමළ බසින් ලිවීමට සහ දෙමළ භාෂාවෙන් ලියැවුණු ඕනෑම ලේඛනයක් කියවීමේ

කුසලතාවන්ගෙන් පරිපූර්ණ වනු ඇත.

එමගින්

- රාජ්‍ය භාෂා ප්‍රවීණතා විභාගයේ මට්ටම III සඳහා පෙනී සිටීමේ හැකියාව ද ලබා ගත හැකි ය.

## වැඩි විස්තර සඳහා


පීඨාධිපති කාර්යාලය
ශාස්ත්‍ර පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය
රීඩ් මාවත
කොළඹ 07.

**නීෂා මිය** : 0115-748324
ෆැක්ස් : 011-2505758
අන්තර් ජාලය: arts.cmb.ac.lk


# කථන දෙමළ භාෂා සහතිකපත්‍ර පාඨමාලාව (කෙටිකාලීන)

# பேச்சுத் தமிழ் சான்றிதழ் பாடநெறி (குறுங்காலம்)

**ශාස්ත්‍ර පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය**

***කථන දෙමළ භාෂා පාඨමාලාව (කෙටිකාලීන)***

- **කා සඳහාද:**
  **ඉතා චතුර ලෙස දෙමළ බසින් කථා කිරීමට සහ සවන් දීම, කියවීම සහ ලිවීම යන දෙමළ භාෂා කුසලතා වර්ධනය කර ගැනීමට අභිලාෂයක් දක්වන්නා වූ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්, ඩිශ්වඩිද්‍යාල ශිෂ්‍ය- ශිෂ්‍යාවන් සහ පාසල්වල දෙවෙනි බසක් ලෙස දෙමළ බස උගන්වන්නන් සඳහා වර්තමාන රාජ්‍ය භාෂා ප්‍රවීණතා විභාගයේ මට්ටම III සහ IV ට අදාළ විෂය නිර්දේශයට අනුකූල ව ඉගැන්වේ. (කිසිදු දෙමළ භාෂා දැනුමක් අවශ්‍ය නො වේ.)**

## 1. හැඳින්වීම

මෙම පාඨමාලාව ඉලක්ක කොට ඇත්තේ දෙමළ බසින් කථා කිරීමට අභිලාෂයක් දක්වන්නන්ට දෙමළ බසින් සංන්වේදනය කිරීමේ පුහුණුව සම්පාදනය කිරීම සඳහා ය.

**එහෙයින් ඉලක්ක කණ්ඩායම වන්නේ කිසිදු දෙමළ භාෂා දැනුමක් නොමැති වැඩිහිටි විද්‍යාර්ථීන් ය.**

දෙමළ බසින් කථා කිරීම තුළින් මූලික ජාතීන් අතර අන්තර් සම්බන්ධතාව ගොඩනගමින් ජාතික ඒකාබද්ධතාව ඇතිකිරීමට ද මෙය වක්‍ර ව දායක වනු ඇත.

## 2. අරමුණු හා පරමාර්ථ

මෙම පාඨමාලාවේ අරමුණ වන්නේ සවන් දීම, කථා කිරීම, ලිවීම, කියවීම යන දෙමළ භාෂා කුසලතා මුල සිට වර්ධනය කිරීම යි.

1. දෙමළ භාෂා ශබ්ද සහ ඒවා හගවන අකුරු, සහ ශබ්ද උච්චාරණයේ වෙනස්කම් හඳුන්වා දීම

2. විද්‍යාර්ථීන්ට වේලාව, පිහිටීම, දිශාව, දුර, දෛනික ගතිපැවතුම්, සමාජ සංසිද්ධි සහ කාර්යාලීය කටයුතු විමසීමටත් පැවසීමටත් අවශ්‍ය දෙමළ භාෂා වාග් මාලාව සහ වාක්‍ය රටා සම්පාදනය කිරීම

## 3. ඉගෙනුම් විධික්‍රමය

- පරිපූර්ණ ව ම ඉගෙනුම් කේන්ද්‍රිය සංනිවේදන විධික්‍රම උපයෝග කර ගනු ලබන ප්‍රවේශයකින් දෙමළ භාෂා පුහුණු කාර්යය සිදු කෙරේ.

- මෙම පුහුණු වීම් කාර්යය සඳහා සම්මුඛ සැසි (face to face sessions) කණ්ඩායම් ක්‍රියාකාරකම් (group activities), යුගල ක්‍රියාකාරකම් (Pair works) සහ ඒක පුද්ගල ක්‍රියාකාරකම් (Individual activities) භාවිත කෙරේ..

## 4. අධ්‍යයන උපකාරක

කථන දෙමළ භාෂා පුහුණුව සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන රාජ්‍ය භාෂා ප්‍රවීණතා විභාගයේ III සහ IV මට්ටමේ විෂය නිර්දේශයට අනුකූල ව සැකැසුණු ක්‍රියාකාරකම් සහිත විශේෂ අධ්‍යයන අධ්‍යයන ආධාරක 15 ක් භාවිත කෙරේ. (එක් අධ්‍යයන ආධාරකයක් පැය 04 කි.)

## 5. පාඨමාලා කාලය

පාඨමාලාවේ පුහුණු කිරීම් කාලය පැය 60 කි.

කි.

ර්ට අතිරේක ව විද්‍යාර්ථියා පැය 60 ක අතිරේක අතිරේක කාලයක් ස්වයං අධ්‍යයනෙහි නිරත ව නිරත ව පුහුණු වීම්වල නිරත විය යුතු ය. ක්‍රියාකාරකම් කළ යුතු ය.

## 6.. පන්ති පැවැත්වීම

**ඉරිදා දිනවල** පෙ.ව **09.00 – 01. 00**

කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨ ගොඩනැගිල්ලේ දී

## 7. උපදේශන මාධ්‍යය

සිංහල

## 8. පාඨමාලා ගාස්තුව

| | |
|---|---|
| පාඨමාලා ගාස්තුව: | රු.15,000/- |
| (අධ්‍යයන උපකාරක සහිතව) | |
| අයදුම් පත්‍ර ගාස්තුව: | රු. 500/- |
| ලියාපදිංචි ගාස්තුව: | රු. 1000/- |
| **මුළු පාඨමාලා ගාස්තුව** | **රු .16,500/-** |

**මුළු පාඨමාලා ගාස්තුව වූ රු. 16,500/- ක මුදල මුදල ලියා පදිංචි අවස්ථාවේ දී ගෙවිය යුතු ය.**

9. **ඇගයීම් ක්‍රමය**

සහභාගිවන්නන්ගේ භාෂා කුසලතා වර්ධනය අඛණ්ඩ ව මතු දැක්වෙන අයුරු ඇගයේ.

- විශේෂ මුද්‍රිත අධ්‍යයන ආධාරක උපයෝග කොට ගෙන සතිපතා කෙරෙන පුහුණු කිරීම්වලට අදාළ ක්‍රියාකාරකම්වලින්.
- විද්‍යාර්ථීන් වෙත සපයනු ලබන පැවරුම් 1 සහ 2 මගින්

10. **අවසන් පරීක්ෂණය**

- ලිඛිත පරීක්ෂණය ( පැය 02)
- වාචික පරීන්ෂණය ( එක් අයෙකුට විනාඩි 15 )

අවසාන විභාගයට පෙනී සිටීම සඳහා 80% අවම පන්ති සහභාගිත්වයක් අනිවාර්ය වේ.

11. **අවසන් ප්‍රතිඵල**

| | |
|---|---|
| පැවරුම් 2 න් | 10% |
| ලිඛිත පරීක්ෂණයෙන් | 35% |
| වාචික පරීක්ෂණයෙන් | 55% |
| | 100 |

12. **සාමර්ථ**

| | |
|---|---|
| 0-39 දුර්වල | 40-59 සාමාන්‍ය |
| 60- 74 කුසලතා | 75-100 විශිෂ්ට |

13. **සහතික පත්‍ර**

ජාත්‍යන්තර ව පිළිගත් රාජ්‍ය විශ්ව විද්‍යාලයක් වන කොළඹ විශ්ව විද්‍යාලය විසින් පිළිගත් සහතිකයක් පිරිනැමේ.

14. **ආචාර්ය මණ්ඩලය**

නූතන භාෂා ඉගැන්වීම් විධික්‍රම භාවිත කරමින් දිගු කාලයක් දෙමළ භාෂා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි නියැළුණු ප්‍රවීණ බාහිර කථිකාචාර්යවරුන්

15 **ඔබ එකඟ විය යුතු දෑ**

පාඨමාලාවට ලියාපදිංචි වන ඔබ කොළඹ විශ්ව විද්‍යාලයේ නීති රීති සහ කොන්දේසිවලට ද පාඨමාලාවේ නීති රීති සහ කොන්දේසිවලට ද එකඟ විය යුතු ය

**පාඨමාලාවට ලියාපදිංචි වීම**

☞ **මෙහි ඇති ඉල්ලුම් පත නිවැරදිව සම්පූර්ණ කර**

2017 අප්‍රේල් මස 07 වෙනි දින හෝ ඊට පෙර නියෝජ්‍ය ලේඛකාධිකාරි, පීඨාධිපති කාර්යාලය, ශාස්ත්‍ර පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය, රීඩ් මාවත, කොළඹ 07 යන ලිපිනයට තැපැල් මගින් එවීමට හෝ එම ස්ථානයට ගෙනැවිත් භාර දිය හැකි ය.

අනතුරුව ලියා පදිංචිය සඳහා දන්වනු ලැබේ.